# පෙම් කවිය

හන්දියේ වින්කලේ ළඟ හවස හැමදාම
සයිකලේ නවතාන මං බලා උන්නාම
වැඩපොලේ ගේට්ටුවෙ ඉබි යතුරු ඇරුනාම
කලබලේ නුඹ ඇවිත් හිනැහේය එකසේම

පැක්ටරියෙ මැසින් ටික මහ හඬින් අඬනවා
උඹේ ඉකි බිඳුම් හඬ ඒ හඬට වැහෙනවා
පැය අටක් බිව් කඳුළ හිත ඇතුලෙ තියෙනවා
අමතකව උඹ හවස මල් හිනා නගනවා

ගමෙන් උදුරන් ඇවිත් සිදාදියෙ හිටෙව්වට
මේ පොළව සරු නැතිය අපේ ජීවිත වලට
ආදරයෙ සිසිල් දිය පොදක් විසි කර සිතට
ජීවිතය ගොඩගන්න හිතෙන්නේ මොන පවට

පරවෙන්න ළඟ මලක සුවඳ සෙව්වා වගෙයි
බක්මහේ ගිණි ඉරෙන් හිම සිසිල නොමලැබෙයි
වනසන්න බැහැ තනිය දෙසිත උඹගෙයි මගෙයි
දැවටෙන්න සිහිනයක පමා වුවා වැඩියි

මගේ දුව මං නැතිව ඉකි ගසා අඬනවා
හීනෙකින් වගේ මට හැම විටම ඇහෙනවා
ඒ හඬට මගේ හිත මොහොතකට සැලෙනවා
නංගියේ හෙට උදේ මං ගෙදර දුවනවා



# මායාව

මගේ උරපත රිදවන
නුඹේ කඳුලේ උණුසුම
පුබුදුවයි මා සිහින දැහැනින්

නොඅසනා පැනයෙන
මුනිවතම දරමින
සැරිසරයි මා මනස දසතේ

ඇසේ පහසට රහසින
හිතේ ලෝදිය විලසින
සැඟවේය මා කඳුල තනිවම

සරසන්න ලෝකය
මල් පුබුදන්න තුරු ලිය
ගිල ගනියි දුක් සුසුම බෝ ලෙස

සනසන්න ලෝකය
රැකෙ ගන්න යුග දාමය
රස විඳිමු තිත්ත මධු විලසින

# සිසිරයේ පිපුන මල

විනාශය හිස දරන් කළු ගලක පිපුන මල
සිනාසෙන තරම දැක අනේ දුක සිතේ මට
උදෑසන පිපුන හිරු වැළඳගත් පින්න බිඳ
විලාපය ඇසේ මට නෙත් පියා සිටින සඳ

වසන්තය නිමාවේ පිපෙන එක දුලබ මල
මගේ මේ උයන් තෙර කිසිදාක පිපෙනු නැත
වාලුකා කතර මැද පිබිදෙනා පතොක් මල
මුදුනතෙහි කිසිදාක පිණි බිඳක් රැඳෙනු නැත


නුඹේ සියුමැලි සිතට නොවැටහෙන දෙයක් ඇත
කළු ගලක පිපෙන්නට නෙළුමකට වරම් නැත
නෙළුමකට ඉඩ සදන සුනිල දිය පිරුනු විල
කාන්තාරයක් මැද කිසිදාක සැදෙනු නැත

ඈත පිපි රතු මලක පෙති පහස ලබන්නට
මෑත සිටිනා මගේ දෑත දිගු නැතිය ලඳ
දෑත ළඟ පිපුණු දින මුදු සුමුදු නෙළුම් මල
මගේ රළු පහස විඳ මැළව බිම වැටෙනු ඇත

නුඹ නැග සිටින මනහර සමනළ තටුව
මා රළු පයට හොඳටම සියුමැළි වැඩිය
රිදවන නමුදු ගල් මුල් කටු මා දෙපය
විඳ හුරු පුරුදු රළු පොළවම මට හොඳය



# අයිතිය



නිවා සඳවත එළිය
ඉඩ දිය යුතුය අහසම
දිලි දිලී සැලෙන්නට
අර ඈත තනි තරුවට

වැසුවාට කවුළු දොර
නිශාචර මද සුළඟ
කෝපයෙන් මොර ගසන
හඬ නොඅසන්න සොඳුරිය

නිවනු මැන පහන් සිල
තවත් වැඩියෙන් දකින්නට
නුඹෙ නීල නෙත් තරු
යුගලයේ කාන්තිය

# නිදහස

සරන්නට සිසාරා
අහස් කුස නිදැල්ලේ
පියාපත් සවි ලැබුන කිරිල්ලී
ඇස පිනන මන බඳින
නිල් අහස බියකරුය කිරිල්ලී

අර ඈත වලාකුල
කොයි කරම් ලස්සනද බලද්දී
වසා ඇත්තේ එයින්
වෛරයේ අසනියයි කිරිල්ලී

රතු පාට තාරුකා
පාන ඉඟි බිඟි සිනා නොසෙල්ලී
දුරස් වී සිටියොතින්
පිළිස්සෙන්නේ නැතිය කිරිල්ලී





# මාළිගාව

ගං දෑල මුර කරන
විසල් නා අතු පතර
පරදවා මා සොයා
ගලන හිරු රැස් දහර
ගං දියෙන් මතුව එන
මා සිරුර වෙලාගෙන
මොහොතකට උණුසුමක්
ලබා දෙයි මා ගතට

ඈත සිට පාව එන
සිය දහස් මල් පියලි
මා මතින් දිය පිටින්
නිරන්තර ගමනකය
නොරැඳීම එකම එක
වරක් හෝ මා ගෙලෙහි

හෙළන්නට සුසුමකුදු
කාලයක් නැත ඉතිරි
ගං පතුල සූරමින්
වට්ටි පුරවා ගමින්
රනින් මිණි මුතු වලින්
ගොඩ නගමි මාළිගේ

පාරුවේ තට්ටුවේ
මගේ රන් මාළිගේ

දවස පුරා රන් රුවනින් හැදූ මගේ මාළිගාව
ලොරි පුරවා පටවාගෙන අරන් ගියයි මාළිගාව
කුමාරවරු බඩගින්නේ බලා සිටින මාළිගාව
හැන්දෑවට මං රජවෙන මගෙ කටු මැටි මාළිගාව



# පිටුවහල් දේශය

මුදල් තාපයට මැළවුන
මිනිස්කම් තණ පඳුරු සේ
යන්තමින් පන ගැට ගසා
ගනු නොහී වැලපෙනු ඇසේ

මා අතය මෙහි බලය
කියා පාමින් උඩඟුව
සැඩ නොදැමුනු බවම පතුරා
මුදල් සැඩ හිරු අහස ජයගෙන

ඇස පිනන මන බඳන
සුර ලොවකි දස අතෙහිම
පිය ඔසවන්න නොහැකිය
මං මුලා වැල් අඩු නැත

ගල් බොරළු පා රිදවන
හෙළයි මා පියවි ලොව වෙත
මුතු අතුල මං මාවත්
කොහි වෙද මේ සිහින කොදෙව්වේ?



# පිළිම නෙළීම

පලින් පල විසල් නගරේ
දිලෙන්නට තැනෙන නිබඳේ
දකින්නට කදිම ප්‍රතිමා
බලන් ඇස් යොමා

වඩුවන් බොහොසේ වෙහෙසී
කල් බලන් ඉඳන් සැනසී
සුමිතුරන් රුවින් තනනා
පිළිම මේ දෙසේ

උනුන් පරදනා රිසියේ
උසින් සහ මහත සමසේ
අරන් පෙල පිළිම ඉදිවන
බලන්නට අගේ

ඇස් පිනා දනන් නගරේ
සෙල් පිළිම ලෙසින් දිසියේ
තට්ටු කර බැලූ දවසේ
බොල් හඬක් නැගේ

මිතුරු වඩුවරුන් නැත්තෙන්
කටු මිටිත් අරන් දැතින්
නෙලන්නට මගෙම පිළිරුව
මටම දැන් සිතේ



# කවිය

කියන්නට මෙකව නුඹට
බලා සිටියෙමි
වසන්තය එළැඹෙනා තුරු

අනේ මා දැන සිටියානම්
සිසිරයේ දී
මගේ කාලය නවතින බව....!!

# දිග කතාවක්

සිනා සෙන්නට
කියා දී මට
හඬනු කිම ඔබ
ඉකි ගසා...?

# හතර රියන යට

රනින්නට මායිම්
බඳින්නට වැට කඩුළු
වෙහෙසුමක් නැත්තෙන්
අහා කෙතරම් සැනසීමද
මේ හතර රියන යටදී

ඇවිදවා මායිම්
කොටුකරගත් වපසරියද
අතැරදා සඳහට
අසල්වැසියාද සැනසේ
යාබද හතර රියනේ

එබෙන්නට මා දෙස
ඕනෑ කමක් නැතියෙන
යාබද හතර රියනේ
අසල්වැසියාද නිහඬය
මේ තරම් සැනසීමක්
කොහි වෙද මිනිස් ලොව තුල

රිසි ලෙසට හිනැහෙම්
මට ඇවැසි විට හඬම්
අලස සුව විඳිම්
හතර රියනේ සැනසෙම්



# හිමේ නඩුව

අනේ මහතුනේ මට වූ වියෝයා
කැලේ ගහ කොලද හොරු ගෙන ගියෝයා
මගේ දරු පැටව් බඩ ගින්දරේයා
හිතේ ගිණි ඇහේ කඳුලට හැරේයා

වනේ අපේ රජ දහනේ වපසරිය
හොරා ගත් එවුන් නොදනී මේ හරිය
අපේ දරුත් උන් දරු මෙන් කෙළිබරය
කැලේ දිග පළළ දැන් කෙළියට මදිය

මගේ දරුන් බඩගින්නේ අඬන්නේ
මගේ පපුව දරු ගින්නෙන් දැවෙන්නේ
විනේ කැටුව මිනිසුනි නුඹ නොදන්නේ
වනේ අම්මලාටත් දුක දැනෙන්නේ

බඩේ ගින්න ඉවසනු බැරි තැනේයා
ගමේ හැදුන ගහ කොල ඇස ගැටේයා
රැළේ අතැර ගම් වැදි නෑ සියෝයා
නුඹේ රැදුරු ගිණි බටයෙන් නැසේයා

සූරිය දෙවියනේ මේ ගහ කොල සැදුව
කාටද කියන්නේ අප මේ අවනඩුව

# අතුරුදන් වූ මිත්‍රයා

දොරින් දොර මළ බෙරය
පළින් පළ මරණයය
දුක් සුසුම් අඳෝනා
තර්ජනය ගර්ජනය
ගිණි වැදුනු මුතු ඇටය
ඉන්දියන් සාගරේ
කඳුළු බින්දුවය මෙය

බිමට බා ගත් හිසින්
නුඹ ඒය ගාටමින්

හැමදාම අඳින එක
රැලි ගැසුන කමිසයද
කිළිටි එක කලිසමද
ගෙවී ගිය පාවහන
පැළඳ නුඹ ගෙට ඒය

බත් පිඟානක් බෙදා
නුඹට දෙන අම්මාය
“....දවස් තුනකට පස්සෙ
අද තමයි බත් කෑවෙ....!!”

කියා නුඹ හිනැහේය
පසුතැවිල්ලක් නැතිය



“...කුමරියක් වෙලා ඇය
සඳ දිලුන මේ රැයේ
මගේ සිතුවිලි ගොමුව
අතර මැද සැඟවුනේ....”

නුඹේ ඒ කවි අතර
සැඟව ගිය සිහිනයේ
නිමාවක් දකින්නට
ඇයිද පසුබට වුනේ..?

මගේ ප්‍රේමය හෙටටයි
අද මගේ සිත ලොවටයි
ආත්මාර්ථය පාගා
පරාර්ථය ගොඩ නංවමි
හිතේ ගින්දර සඟවා
ඇයට සමු දුන්නෙමි



දෙමාපිය සොහොයුරු
අධ්‍යාපනය පෙම්වතිය
මල් පිපෙන තාරුණ්‍යය
දෝතින් ගෙන විසිකරදා
ඇස් ඉස් මස්ද දන් දී
බුදු බවද පතන්නේ
මේ ලොව දරන්නේ
මිසදුටුන් බව නොදනීද..?

දෙවියන් වහන්සේගේ පුත්‍රයාත්
ඇණ ගැසූ පවිටු ලෝකයය මේ
තවත් දහසක් පුත්‍රයන්
ඇණ ගසන එක කප්පක්ද..?

සබඳ නුඹ එක මගෙක
මම වෙනත් මං පෙතක
ප්‍රපාතය දැක දැකම
මං මුළාවකය නුඹ

වස්සාන කලුවරට
පෙම් බැන්ද සාටකය
කළුව තුල අසනි සර
සැඟව කල් බලන බව
සිහි නොකල පව කිමද

විලිස්සන රකුසු දත්
පිරික්සන උකුසු ඇස්
මග හරිනු හැකිවේද

කල්පනාවකය නුඹ
බොහෝ දුර මා නොදත්
විඩාබර දෑස් යුග
මොහොතකට මා වෙතය

සමුගනිමු සබඳ අප
මතු දිනෙක හමුවන්න
දිනූ පසු අපේ ලොව

යළිත් අප කිසි දිනෙක
හමුනොවන බව නොදැන
නුඹේ ලොව කිසිදිනෙක
නූපදින බව නොදැන




සිත තුලම සැඟව ගත්
කඳුලු බර දරාගෙන
හැරීනොබලා යළිත්
පිය මනින නුඹේ රුව
මළානික සැඳෑ හිරු
කිරණ තුල සැඟව යයි

වැලි තලාවෙන් යට
සැඟවුන නිල් මැණිකෙන්
ලෝකයට පලක් වෙද
ළදරු මුව සිනාමල් පුබුදුවන
තුරුණු සිත සෙනෙහසින් පුරවන
සුපිපී සුවඳ දෙන
වන මලක් තරම්න්වත්...
නුඹ වන මලක් සේමය...

කහපාට සඳ දියව
ගලායන මහරෑට
සුවහසත් මල් පිපෙයි
ලොව නිදා සිටියාට

අරුනැල්ල තණ නිල්ල
සිපගන්න පෙරදීම
පරව යයි බෝ දුකින්
කාටවත් නොකියාම

අකාලයෙ පිපුන මල්
පරවිය යුතුය ඉක්මනින්
පරවෙන්න බෝ කළින්
නලා දැමුවෝය උන්



ගොම්මනට රතුපාට
ආකහේ ඈත සිට
ගාටමින් නුඹ යනෙන
හැටි පෙනෙයි මට තවම
සුරත මිටි කරගත්ත
රතුපාට හදවතකි
ආත්මාර්ථය අතැර
ලෝකයට ප්‍රේම කල
සැබෑ වූ මිනිසෙකුගෙ
රතුපාට හදවතය

රතු පාට මල් බොහෝ
තලා පොඩි කරලාය
ඒ වුනත් මල් සුවඳ
තවම සිත තුල වේය



## පූජේමි බුද්ධං

වැව් කණ්ඩියේ පරවුන මල් විසුලාය
ඒ මල් හැඬූ බවට සලකුණු තිබුනාය
කඳුලේ සිසිල වැව් දිය යට රැඳුනාය
මගෙ නංගිගේ රුවට නෙළුමක් පිපුනාය

නෝනා මහතුනේ මේ මල් අරගන්න
මල් ආසනේ අතුරා පින් ලැබගන්න
බුදුකාමරේ දස අත පැතිරී යන්න
මගෙ නංගිගේ සුවඳට ඉඩ කඩ දෙන්න

## පනොක් මල

පනොක් මල
මම නුඹට
බොහෝ ආදරෙයි....!
නුඹ ලස්සන නිසා නම් නොවෙයි....
මේ රුදුරු කතරේ
පිපුණු
එකම මල
නුඹ නිසයි....!

# උමා

හිරු මලට ගිණි වැදුන තල් අරඹ මුවාවේ
පිණි පොදක් වීය නුඹ මගෙ හිතට උමාවේ
මිනිස් කම වල් වැදී සැගව ගිය වෙලාවේ
නුඹ පමණි මගෙ සිතට ඒ සුවඳ ගෙනාවේ

කෙන්ඩියේ පැන් පොදේ තරහ රස තිබුනෙ නෑ
මං උඹේ හතුරෙකැයි උමා උඹ හිතුවෙ නෑ
තුන් යමේ බංකරේ සුව සිහින පෙනුනෙ නෑ
ඒ උනත් මගෙ හිතින් උඹේ රුව මැකුනෙ නෑ

හෙට උදේ යුද බිමේ වියරු මිනිසුන් අතර
මායි නුඹෙ සොහොයුරයි දෙපිල තුල සිටිනු ඇත
මිනිස් කම වෙඩි වැදී අසරණව මියෙන සඳ
වෛරයේ ගිණි සිලෙන් තල් අරඹ දැවෙනු ඇත

පමා නොම වී නුඹේ තල් වැටෙන් පැන ගන්න
අමාරුය දෙපිලේම ඇස් වලින් ගැලවෙන්න
අනාදරයට නොවෙයි එපා නුඹ දුක් වෙන්න
නොආවොත් මං උඹේ සිනා පොද දැක ගන්න

කමන්න මගෙ බසට මා වැරදි නම් ඉතින්
බලන්න එහා ලොව තල් වැට පලා නෙතින්
දිනන්න අපේ ලොව තවත් කල් නැති බැවින්
පනින්න තල් වැට අල්ලාන මගෙ අතින්



# පහන් තරුව

යා නොහැක නුඹ සමගින්
දෑහිලි පටලවා ගනිමින්
පහන් තරුවක් විලසින්
බලා සිටිනෙමි එබී රහසින්

යනෙන මාවත වැරදී
මං මුලා වුන දිනදී
බලනු නොම වැරදී
මග සදන තරු එළිය සුසැදී

උදුල පුරසඳ හමුවේ
පැරද සැඟවිය යුතුවේ
උරුමය කුඩා තරුවේ
හැඳින මා හද නිබඳ ගොළුවේ

තුමුල කඳු සිරසේ
මුවා වීගෙන රහසේ
දුටු නොදුටු විලසේ
සැඟව කඳුලක් සලමි දිගැසේ

# මරණ මංචකය

මලානික ඉර එළිය
කවුළුවෙන් වැගිරේය
පිච්ච මල් සුවඳ ගෙන
මද පවන විසිරේය
විඩා බර සිත නිවා
සිසිලසක් පැතිරේය
නුඹේ ඉකි බිඳුම් හඬ
හදවතට වදදේය

ආකහේ ඈත කොන
කළු වලා කැටි ගැසේ
එමැද සැලි අසනියේ
ගිණිකනට ඇස දැවේ
සිත නිවී පහන් වුන
අවසාන මේ පැයේ
නුඹේ කඳුලේ  සිසිල
නලලතෙහි මට දැනේ



විහඟ ගී රාවයක
මිහිර දෙසවන ගැටේ
පුළුන් රැල්ලක් ලෙසින
සැහැල්ලුය සිත මගේ
මගේ කෙහෙ අතර රැඳි
මුදු ඇඟිලි තුඩු නුඹේ
උහුලගත නොහැකිවන
මහ බරක් ලෙස දැනේ

මා නික්ම යා යුතුවූ
කල පැමිණි බව හැඟේ
නුඹ මෙතැන සිටින සඳ
කෙලෙස යන්නද සිතේ
මසුරැ ලෙස දෑත බැඳ
වැළඳ ගම් ජීවිතේ
යා යුතුවූ නමුදු දැන්
නොයන්නට මට සිතේ

# වසන්තයේ නිමාව

කොල හැලුන තුරු අතර
හිම පියලි ඉහි කරන
කැටි ගැසුන මිහිදුමට
හිරු පැරද ඉකිගසන
මා තරව වැළඳගත්
මගේ සිසිරය මේය

වසන්තය පුරාවට
කෙලි කවට බස් දෙඩූ
කුරුල්ලන් කොතැනවෙද
අද මගේ සිසිරයේ
මා අතැර දා ගිහින්



නිදිවරන ගිනී උදුන
අවසාන ගිනී පුපුර
සඟවාන අලු අතර

හිරිවැටුන ඇඟිලි තුඩු
දිගහරිනු කෙලෙසකද
ලියන්නට ජිවිතේ
අවසාන පද හතර

මිදුන වැහි බින්දුවක්
කවුළු දොර මත රැඳී
පාළු කුටියට එබී
ඔච්චමට ඉහි කරයි

තනි කමට ගුලි වෙන්න
මගේ පාළු ලෝකයේ
වසාගමි පියන්පත්
දොර කවුලු දැන් ඉතින්

ගෝටයාටත් බෝටයාටත් රැවටෙමින්
වේදනාවෙන්
කළකිරීමෙන්
සුසුම් හෙළමින්
ජීවිත අරගලයේ යෙදී සිටින
අපේ අවිහිංසක එහෙත් නුගත් මිනිස්සුංට
කන්ද උඩ මාළිගාව කෙටිකතා ටිකම ඇති
උංගේ නුවණ පාදාගන්ඩ.

**ජයසේකර අපොන්සු**

# කන්ද උඩ මාළිගාව

ජගත් ජේ එදිරිසිංහගේ කෙටිකතා සංග්‍රහය

**සාර ප්‍රකාශණ**
94/1 අතුරුගිරිය පාර
කොට්ටාව